**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2023**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (“මණ්ඩලය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**අවධාරණය කරණු ලබන කරුණු**

මගේ මතය තත්ත්වාගණනය කිරීමක් සිදු නොකර, මූල්‍ය ප්‍රකාශනවල 2.5 සටහන සහ 3.15 සටහන වෙත අවධානය යොමු කරමි.

(අ) 2024 අගෝස්තු 09 දින ගරු කථානායකතුමා විසින් සහතික කර තිබුණු 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනතේ 193 වගන්තිය යටතේ ඡේදය (1) මඟින් අවලංගු කිරීමට නියමිත 1978 අංක 04 දරන ආයෝජන මණ්ඩල නීතිය යටතේ වන 2.5 සටහන වෙත අවධානය යොමු කරමි. කෙසේ වෙතත්, 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනතේ 1 වගන්තිය යටතේ ඡේදය (2), II කොටස, III කොටස සහ 193 වගන්තිවල විධිවිධාන බලාත්මක වන දිනය, මෙම පනතට අනුව ගරු කතානායකතුමාගේ සහතිකය තහවුරු කරන දිනය වන අතර 1 වගන්තියේ ඡේදය (3) ප්‍රකාරව, II කොටස, III කොටස සහ 193 වගන්තිවල විධිවිධාන බලාත්මක වන්නේ, අමාත්‍යවරයා විසින් නියමය ගැසට් පත්‍ර යෙහි ප්‍රසිද්ධ කිරීම සිදු කරන දිනට (පත් කරන ලද දිනය) පසුව පමණක් බවත් එය වගන්ති 1 හි උපවගන්ති (2) තුළ සඳහන්ව ඇති පරිදි කතානායකතුමාගේ සහතික කරන ලද දින සිට මාස තුනක කාලයක් ඇතුළත දිනයක් විය යුතු බවත්ය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අඛණ්ඩ පැවැත්මකින් පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳ කළමනාකරණය විසින් තක්සේරු කර තිබුණු අතර අපේක්ෂා කළ හැකි නුදුරු අනාගතයේ දී ආයෝජන මණ්ඩලය, පවත්නා සම්පත් භාවිතා කරමින් එහි මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව පවත්වා ගත හැකි බවට සාධාරණ අපේක්ෂාවක් කළමනාකරණය සතු වේ. ඒ අනුව,1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය අපේක්ෂිත අවලංගුවීම හමුවේ වුවද, ශ්‍රී ලංකා ආර්ථික කොමිසම මගින් මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සිදු කරගෙන යනු ලබයි. එම නිසා, අපේක්ෂා කළ හැකි නුදුරු අනාගතය සම්බන්ධයෙන් පවතින සියලු තොරතුරු සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ඈවර කිරීමක් හෝ මෙහෙයුම් කටයුතු අවසන් කිරීමක් පිළිබඳ අවශ්‍යතාවයක් අපේක්ෂා නොකරයි. එබැවින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය විසින් අඛණ්ඩ පැවැත්ම පදනම තවදුරටත් පවත්වා ගෙන යනු ලබයි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සම්බන්ධයෙන් වූ මෙම පනතෙහි විධිවිධාන මෙම වාර්තාවේ දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මම 3.15 සටහන වෙත අවධානය යොමු කරන අතර එම සටහනෙහි සඳහන් පරිදි 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 32 වගන්තිය යටතේ වර්තමානයේදී ආයෝජන මණ්ඩලය, සමාගම්

ආදායම් බදු වලින් නිදහස් වේ. කෙසේ නමුත්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත 2018 අප්‍රේල් 01 දින බලාත්මක වීමත් සමඟ සාමාන්‍ය නිදහස්වීම් ඉවත් කර තිබුණි. 2017 වර්ෂයේදී, මණ්ඩලය විසින් මෙම නව නීති පැනවීම මගින් ආයෝජන මණ්ඩලය බදු ගෙවීමට ඇති බැඳියාව සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීම සඳහා නීතිපතිතුමා වෙතින් මතයක් විමසා තිබුණි. මෙම කරුණ සමථයකට පත් කර ගැනීම, මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ආයතනවලින් ලැබිය යුතු මුදල් රු.1,480,032,535 ක් වූ අතර එය පෙර වර්ෂයේ අදාළ අගයට වඩා සියයට 69 කින් වැඩි අගයකි. | හිඟ මුදල්වලින් වැඩි ප්‍රමාණයක් වසා දමා තිබුණු සහ අවලංගු කර තිබුණු ව්‍යාපෘතිවලින් ලැබිය යුතු මුදල් වන අතර භාණ්ඩාගාරයේ අනුමැතිය සමග අය කර ගත නොහැකි මුදල් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික ගාස්තු වෙනුවෙන් සිදු කර තිබුණු හානිකරණය සඳහා වූ වෙන් කිරීම රු.276,287,243 ක් වශයෙන් දක්වා තිබුණු අතර එය 2023 දෙසැම්බර් 31 දිනට වාර්ෂික ගාස්තු සඳහා ලැබිය යුතු මුළු මුදලින් සියයට 87 කි. | සටහන් කර ගන්නා ලදී. | -එම - |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට වෙනත් ලැබිය යුතු මුදල්වලින් හිඟ මුදල්, රු.40,574,617 ක් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් සඳහා හිඟව පැවතුණි. | මුදල් අය කර ගැනීම සඳහා සහ අය කර ගත නොහැකි මුදල් භාණ්ඩාගාර අනුමැතිය සමග කපා හැරීමට පියවර ගනු ලැබේ. | -එම - |

**1.5.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තු 8 ක් වැඩ අවසන් කර තිබුණද එම කොන්ත්‍රාත්වලට අදාළ රු.2,375,127 ක රඳවා තබා ගත් මුදල් වර්ෂ 4 කට වඩා වැඩි කාලයක් පියවීමකින් තොරව පැවතුණි. | රඳවා තබා ගත් මුදල් නිදහස් කිරීමට අදාළ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විමසා බැලීමකින් පසුව මණ්ඩලයේ ආදායමක් ලෙස එම අගයන් සැළකීමට පියවර ගනු ලබන බව. | ගෙවිය යුතු ගිණුම් සැසඳිය යුතු අතර වියදම් ගෙවා දැමීම හෝ ආදායමක් ලෙස හඳුනා ගැනීම කළ යුතුය. |
| (ආ) | විවිධ ණයහිමියන්ට ගෙවිය යුතු රු.3,293,593 ක මුළු මුදල, වර්ෂ 3 කට වඩා වැඩි කාලයක් පියවීමකින් තොරව පැවතුණි. | මණ්ඩලය විසින් විවිධ ණයහිමියන් විස්තරාත්මකව සමාලෝචනය කරනු ඇති අතර විවිධ ණයහිමියන් ගිණුම් පොත්වලින් කපා හැරීමට ඇති හැකියාවන් පිළිබඳව සොයා බලනු ඇත. 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුළ මෙය ගලපනු ලබන බව. | - එම - |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල නීතියෙහි 3 (ඇ) වගන්තිය | විදේශ ආයෝජන ධෛර්යමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණුවලින් එකක් වුවද 2018 සිට 2023 අගෝස්තු 31 දක්වා කාලය තුළදී නුවර කාර්මික උද්‍යානය සඳහා ඇ. ඩොලර් මිලියන 7.004 ක ආයෝජනයක් සිදු කර තිබුණු එක් ආයෝජකයෙකු පමණක් දායක කර ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම කාලය තුළදී, ලෝකය පුරා කොවිඩ් 19 වසංගතය පැතිර යාමත් ශ්‍රී ලංකාව එහි දරුණුම ආර්ථික අවපාතයට මුහුණදී සිටී. කෙසේ වෙතත්, තවදුරටත් සිටින ආයෝජකයන් නැවත ආයෝජනයන් සඳහා ප්‍රවර්ධනය කිරීමට පියවර ගනිමින් පවතින බව. | සෘජු විදේශ ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | නුවර කාර්මික උද්‍යානය තුළ ආයතන 8 ක් ද බියගම අපනයන සැකසුම් කලාපය තුළ ආයතන 3 ක්ද අදාළ පනවා ඇති නීති මගින් අනිවාර්යය කර තිබෙන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අළුත් කර නොතිබුණි. | මණ්ඩලය විසින් සිය මෙහෙයුම් කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම තහවුරු කර ගැනීම සඳහා වූ පාරිසරික අංශයන්ගෙන් සමන්විත කර්මාන්ත සමීපව අධීක්ෂණය කරමින් සිටින අතර අඩුපාඩු නිවැරදි කිරීමෙන් අනතුරුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට පියවර ගනු ලැබේ. | ජාතික පාරිසරික පනත ප්‍රකාරව නියමිත දිනට බලපත්‍ර අළුත් කළ යුතුය. |
| (ඇ) | 2013 නොවැම්බර් 12 දිනැති සහ අංක 13/1599/561/022 දරන කැබිනට් තීරණය | 2023 සැප්තැම්බර් 18 දිනට අනුව, නුවර කාර්මික උද්‍යානය පුළුල් කිරීම සඳහා වූ හෙක්ටයාර් 5.646 ක ඉඩමක හිමිකාරීත්වය මණ්ඩලය වෙත පවරා නොතිබුණි. ඒ අනුව, 2013 වර්ෂයේ සිට කිසිදු ආයෝජන කටයුත්තක් සිදු කිරීමකින් තොරව මෙම ඉඩම නිෂ්කාර්යව පැවතුණි. | 2023 මාර්තු 10 දින කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මෙම ඉඩමෙහි භුක්තිය මණ්ඩලය වෙත භාර දෙන ලදී. තවද, ප්‍රාදේශීය ලේකම්ගේ 2024 පෙබරවාරි 22 දිනැති ලිපියෙන් මෙම ඉඩම සඳහා ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් අවසර ලබා දී ඇත. කෙසේ නමුත්, ඉඩම් කොමසාරිස්වරයා හරහා මණ්ඩලය වෙත නීතිමය වශයෙන් මෙම ඉඩම පවරා දීමේ ක්‍රියාවලිය තවදුරටත් සිදු කෙරෙමින් පවතින බව. | කැබිනට් තීරණයන් ප්‍රකාරව වහාම පියවර ගත යුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ ඒ සම්බන්ධ පසු සංශෝධනයන් | | | |
| | (i) 3.1 වගන්තිය | විධායක අධ්‍යක්ෂවරු 6 ක් සඳහා ඉඩ දිය හැකි සීමාව ඉක්මවා ලීටර් 1440 ක් ඉන්ධන දීමනා ලබා දී තිබුණු අතර එහි එකතුව රු.511,800 ක අගයක් ගෙන තිබුණි. | ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සිය ගමන් සම්බන්ධයෙන් වූ අමතර ඉන්ධන ප්‍රතිපූර්ණය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්/ විධායක අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන)/ විධායක අධ්‍යක්ෂ (කලාප)/ අංශ ප්‍රධානීන්ගෙන් අනුමැතිය/ එකඟතාවය ලබා ගත යුතු බව දන්වා ඇත. | චක්‍රලේඛ මාර්ගෝපදේශයන්ට අනුකූලව පියවර ගත යුතුය. |
| | (ii) 3.2 වගන්තිය | මෙම විධිවිධානයන්ට පටහැනිව නිසි අනුමැතියකින් තොරව රු.1,269,800 ක අතිරේක ඉන්ධන දීමනා ලබා දී තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) යහ පාලනය සම්බන්ධ මාර්ගෝපදේශයන් | | | |
| • 2.6 වගන්තිය | ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා හෝ ආයතනය තුළ වෙනස් ආකාරයේ තනතුරක නිරත වන වෙනත් කිසිදු සේවකයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා ලෙස පත් නොකළ යුතු නමුත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා ලෙස විධායක අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන පත් කර තිබුණි. | 2017 වර්ෂයේ සිට වැඩ බලන අධ්‍යක්ෂවරයා - (මානව සම්පත්) ලෙස රාජකාරී සිදු කළ විධායක අධ්‍යෂකවරයා (මානව සම්පත් සහ පරිපාලන) මෙම චක්‍ර ලේඛයට පෙර සිට මණ්ඩලයෙහි ලේකම් ලෙස පත් කර ඇත. කෙසේ වෙතත්, 2022 මැයි 04 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක අධ්‍යක්ෂවරයා (මානව සම්පත් සහ පරිපාලන) තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. | චක්‍රලේඛ මාර්ගෝපදේශය න්ට අනුකූලව පියවර ගත යුතුය. |
| • 3.2 වගන්තිය | ශේෂ පත්‍ර දිනට පසු මාස 5 ක කාලයක් ඇතුළත සහ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ලබා දීමට පෙර වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීම් (APRM) පැවැත්විය යුතු අවශ්‍යතාවයට පටහැනිව, 2021, 2022 සහ 2023 වර්ෂයන් සඳහා වූ එම රැස්වීම් මෙම විගණන වාර්තාවේ දින වන විටත් පවත්වා නොතිබුණි. | කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා වෙනම රැස්වීමක් නොමැති වුවද, සෑම වර්ෂයකටම අදාළව කාර්යසාධනය සම්බන්ධයෙන් සුදුසු පරිදි ඊට පසු එළඹෙන වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලබන බව. | - එම - |
| (ii) රජය සතු ව්‍යවසායයන් සඳහා වන මෙහෙයුම් අත්පොත | | | |
| • 3.1 සහ 3.2 වගන්තිය | රජය සතු ව්‍යවසායයන් විසින් සිය කාර්ය මණ්ඩලය සහ පාරිශ්‍රමිකය සම්බන්ධයෙන් මහා | 2023 ඔක්තෝබර් 11 දිනැති ලිපියක් මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හරහා මේ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | භාණ්ඩාගාරය වෙතින් අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ නිසි අනුමැතිය තහවුරු කර ගැනීමකින් තොරව මණ්ඩලය විසින් රු.462,463,188 ක දීමනා ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ අනුමැතිය විමසා ඇත. තවදුරටත්, 2024 ජූලි 19 දින ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හරහා මේ සම්බන්ධයෙන් සිහිකැඳවීමේ ලිපියක්ද යවා ඇත. | |
| | • 6.6 වගන්තිය | 2023 වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, දින 104 ක ප්‍රමාදයක් සහිතව 2024 ජූනි 13 දින විගණකාධිපතිතුමා වෙත ලබා දී තිබුණි. | IMAS ගිණුම්කරණ පද්ධතියේ පැවති තාවකාලික දෝෂයක් හේතුවෙන් 2023 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ලබා දීමට නොහැකි විය. දෘඩාංග දෝෂ අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව, මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිතුමා වෙත ලබා දී ඇත. | - එම - |
| (ඊ) | 2022 අගෝස්තු 08 දිනැති අංක පීඊඩී 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | 2.7 ඡේදය | අනුග්‍රාහක දීමනා, පරිත්‍යාග, ආයතනික සමාජ වගකීම් වියදම් සහ ව්‍යාපාර කටයුතුවලින් බැහැර ප්‍රවර්ධන වියදම් ඇතුලු සියලු ආකාරයේ වියදම් අත්හිටුවා තිබුණු අතර අත්‍යාවශ්‍ය වියදමක් නම්, අදාළ අමාත්‍යාවරයාගේ අනුමැතිය හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතුය. එවන් පසුබිමක මණ්ඩලය විසින් නුවර දළදා ඇසළ පෙරහැර වෙනුවෙන් ශ්‍රී දළදා මාලිගාවේ මාධ්‍ය සහ විශේෂ ව්‍යාපෘති ඒකකය වෙත රු.3,000,000 ක මුදලක් ගෙවා තිබුණි. | මණ්ඩලය විසින් ශ්‍රී දළදා මාලිගාව වෙත රු. 3,000,000 ක් පරිත්‍යාග කිරීමට අනුමැතිය ලබා දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ එවකට සිටි අමාත්‍යවරයාගේ ඉල්ලීමක් පදනම් කර ගනිමින් ශ්‍රී දළදා මාලිගාව වෙත පරිත්‍යාගය සිදු කර ඇත. | - එම - |
| (උ) | 2023 දෙසැම්බර් 15 දිනැති සහ අංක PED/P/BOI/3/6/(i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය. | 2023 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ අරමුදලට රු.1,000,000,000 ක මුදලක් ලබා දීමේ කොන්දේසියට යටත්ව, 2023 වර්ෂය සඳහා මණ්ඩලයේ එක් සේවකයෙක් සඳහා වාර්ෂික ප්‍රසාද දීමනාවක් ලෙස රු.50,000 ක් ගෙවීමට මහා | ඒකාබද්ධ අරමුදල වෙත දායකත්වයක් ලෙස රු. මිලියන 1,000 ක වෙන් කිරීමක් කරන ලෙස මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව එම වෙන් කිරීම සිදු කර ඇති බව. | සුදුසු පරිදි, බදු/ ලාභාංශ බෙදාහැරීමකින් පසු රජය සතු ව්‍යවසායයන් සිය සේවකයන් වෙත ප්‍රසාද දීමනා හෝ ලාභ පදනම් වූ දිරිදීමනා ගෙවීම |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරය අනුමත කර තිබුණද ඒකාබද්ධ අරමුදලට එකී ඉල්ලුම් කරන ලද ගෙවීම සිදු කිරීමකින් තොරව මණ්ඩලය විසින් රු.52,633,287 ක් වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | | සිදු කළ යුතුය. |
| (ඉ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2006 | | | |
| 4.2.1 වගන්තිය | මෙම වගන්තියෙහි දැක්වෙන පරිදි, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය කර විධිමත් ආකාරයෙන් යාවත්කාලීන කර නොතිබුණි. | සංශෝධිත ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, අර්ධ වාර්ෂිකව, මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුකූලව පියවර ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,666,592,974 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,921,657,387 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,744,935,587 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පිරිවැටුම රු.2,198,196,745 කින් සහ මූල්‍ය ආදායම රු.1,291,540,351 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නුවර කාර්මික උද්‍යානයේ කාර්යාල ගොඩනැගිල්ල අසල සේවා ප්‍රදේශයෙන් 8'x8' ක ඉඩ ප්‍රමාණයක්, ලංකා බැංකුවේ ජෙනරේටරයේ කාමරය සඳහා වෙන් කර තිබුණද ඒ සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණු බැවින් කුලීය තීරණය කර අය කරගෙන නොතිබුණි. | කල්බදු ගිවිසුම තුළ මෙම කොටස ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | ආයෝජකයන් හට වෙන් කරන ලද ඉඩ ප්‍රමාණයන් කල්බදු ගිවිසුම් මඟින් විධිමත් කර කුලී ගාස්තු ඇතුළත් කළ යුතුය |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 01 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ වගන්ති අංක 16 යටතේ ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් 23 ක් ලැබී තිබුණද අයදුම්පත් 7 ක් පමණක් අනුමත කර තිබුණු අතර එක් ආයෝජකයෙකු පමණක් මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. | අදාළ කාල සීමාව තුළදී ආයෝජන මණ්ඩල නීතිය තුළ ඇතුළත් වගන්ති අංක 16 යටතේ ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් 23 ක් මණ්ඩලය වෙත ලැබී තිබුණු අතර අවශ්‍ය විස්තර අසම්පූර්ණ ආකාරයෙන් ඉදිරිපත් කර තිබීම, රේඛීය නියෝජිත ආයතනය ප්‍රතික්ෂේප වීම, අදාළ රේඛීය නියෝජිත ආයතනවල නිර්දේශ නොවීම ආදී විවිධ හේතූන් මත අයදුම්පත් 10 ක් ප්‍රතික්ෂේප වී තිබුණි. තවද, ආයෝජන මණ්ඩල නීතිය තුළ ඇතුළත් වගන්ති අංක 16 යටතේ අයදුම්පත් 12 ක් අනුමත කර ඇති අතර ව්‍යාපෘති යෝජකයා විසින් මණ්ඩලය වෙත ඉල්ලුම් කළ විස්තර ඉදිරිපත් කර නොමැති හෙයින් එක් අයදුම්පතක් අනුමැතිය ලැබෙන තෙක් රඳවා ගෙන ඇත. | අදාළ අධිකාරීන් සම්බන්ධීකරණය කර ගනිමින් අයදුම්පත් අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ආ) | මණ්ඩලයේ ප්‍රතිපත්තිය අනුව, 2020 සිට 2022 කාල පරිච්ඡේදය වෙනුවෙන් ව්‍යාපෘති යෝජනාවන් සඳහා අනුමැතිය දින 60 ක කාලයක් තුළ ලබා දිය යුතුය. කෙසේ නමුත්, 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල නීතියෙහි වගන්ති අංක 17 යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති අයදුම්පත් 53 ක් මණ්ඩලය විසින් අනුමත කර තිබුණු අතර ඒ සඳහා ඉහත ප්‍රතිපත්තියට පටහැනිව දින 185 සිට 882 ක් දක්වා අතර කාලයක් ගෙන තිබුණි. | 2020 සිට 2022 වර්ෂ තුළදී මණ්ඩලය විසින් දින 60 ක කාලයක් තුළ අනුමත කිරීමට අදහස් කර තිබුණද, එම කාලය තුළ පැවති කොවිඩ් 19 වසංගතය සහ ආර්ථික අවපාතය මධ්‍යයේ, යම් ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීමට ගත වන කාලය, සැළකිය යුතු මට්ටමකින් දිර්ඝ කර ඇත. ඊට අමතරව, යම් ව්‍යාපෘති සඳහා රේඛීය නියෝජිත ආයතනවල අනුමැතීන් ප්‍රමාද වීම්, ඉඩම් සම්බන්ධ ගැටළු සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් ආයෝජකයන්ගේ ආයෝජන හිඟකම ආදී කරුණු ව්‍යාපෘති අනුමත කිරීමේදී වාර්තා වූ ප්‍රමාද වීම්වලට බලපා ඇති බව. | - එම - |
| (ඇ) | 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වගන්තිය යටතේ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ව්‍යාපෘති 45 ක් සඳහා විගණිත දින වන විටත් ගිවිසුම් අත්සන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඊට අමතරව, ආයෝජකයන් 34 ක් සම්බන්ධයෙන් එහි ව්‍යාපෘති අනුමැතියේ දින සිට වර්ෂයකට | ව්‍යාපෘති 34 ක් අතරින් ව්‍යාපෘති 5 ක ගිවිසුම් අත්සන් කර ඇති අතර ව්‍යාපෘති 06 ක අනුමැතිය ඉවත් කර ඇත. ව්‍යාපෘති 2 ක් අක්‍රීය තත්ත්වයේ පවතී. සමාගමක් විසින් දැනට පවතින ගිවිසුමක දිර්ඝ කිරීමක් ඉල්ලුම් කරනු ලබන අවස්ථාවක කලාප කළමනාකරණය අංශය විසින් | කාලීන ආකාරයෙන් ගිවිසුම් පිළියෙල කර අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වඩා වැඩි කාලයක් දක්වා ගිවිසුම් අත්සන් කර අවසන් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද, බියගම අපනයන සැකසුම් කලාපය තුළ කුලියට සිටින පුද්ගලයන් සමග ගිවිසුම් දීර්ඝ කිරීමට අදාළව අත්සන් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රමාදයක් දක්නට ලැබුණි. | අධ්‍යක්ෂකගේ (බියගම අපනයන සැකසුම් කලාපය) අත්සනින් යුත් ප්‍රදානය කිරීමේ ලිපියක් නිකුත් කරනු ලබන බව. මෙම ලිපිය, විධිමත් ගිවිසුමක් අත්සන් කරන තෙක්, කුලී නිවැසියා සහ මණ්ඩලය අතර පවතින තාවකාලික ගිවිසුමක් ලෙස සළකනු ලබයි කෙසේ නමුත්, විවිධ හේතූන් මත කුලී නිවැසියන් සමග යම් ගිවිසුමක් පිළියෙල කර අවසන් කිරීමේදී ප්‍රමාදයන් පවතී. | |
| (ඇ) | විගණනය වෙත මණ්ඩලය විසින් සපයන ලද ව්‍යාපෘති තත්ත්ව වාර්තාව අනුව, 2021 සහ 2022 කාල පරිච්ඡේදයන් තුළදී 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල නීතියෙහි වගන්ති අංක 17 යටතේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති අයදුම්පත් 7 ක් සඳහා 2024 නොවැම්බර් 30 දින වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි. | 2023 අගෝස්තු 31 දිනට පසු ව්‍යාපෘති අයදුම්පත් 4 ක් අනුමත කර ඇති අතර ව්‍යාපෘති අයදුම්පත් 5 ක් අවලංගු කර තිබුණි. ඉතිරි අයදුම්පත් 7 සම්බන්ධයෙන් පාරිසරික අවසරයන් ගැනීමට ප්‍රමාද වීම, නාගරික සංවර්ධන අධිකාරියේ සහ කොළඹ මහ නගර සභාවේ අනුමැතීන් ගැනීමට ප්‍රමාද වීම, ඉඩම් සම්බන්ධ ගැටළු ආදී විවිධ හේතූන් මත අනුමැතිය ගැනීමට ප්‍රමාද වී ඇත. | අදාළ අධිකාරීන් සම්බන්ධීකරණය කර ගනිමින් අයදුම්පත් අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඉ) | 2023 වර්ෂය සඳහා වූ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතියට අනුව, සැලැසුම් කළ මුළු ක්‍රියාකාරකම් 129 ක් අතරින් ක්‍රියාකාරකම් 37 ක් පමණක් අවසන් කර තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මෙහි ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 29 ක් පමණක් විය. | 2023 මාර්තු 29 දින ප්‍රාග්ධන අයවැය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර 2023 මැයි 18 දින භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දී ඇත. පසුව, සැලසුම් ගත 2023 ප්‍රාග්ධන අයවැය සඳහා අනුමැතිය ලබා දීමේ කාලය අහිමිවීම සැළකිල්ලට ගනිමින් සැලසුම් ගත ප්‍රසම්පාදනයන් ගණන අඩු කර වර්ෂයේ දෙවන භාගයේ දී ප්‍රාග්ධන අයවැය සංශෝධනය කර ඇත. අවසන් කරන ලද ඇස්තමේන්තු සංශෝධනය කිරීම, ප්‍රසම්පාදන කමිටු ප්‍රමාදයන්, නැවත ටෙන්ඩර් කිරීම, බාහිර සංවිධාන විසින් සැලසුම් සහ ලංසු ලේඛන පිළියෙල කිරීමේ ප්‍රමාදයන්, කාර්ය මණ්ඩල හිඟය යනාදිය අවසන් ප්‍රතිඵලය සඳහා බලපා ඇත. | නිශ්චිත කාල සීමාවන් තුළ සපුරා ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | 2023 නොවැම්බර් 06 දින බියගම අපනයන සැකසුම් කලාපයේ සිදු කළ භෞතික පරීක්ෂාවේදී ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය සැලකිය යුතු ලෙස පිළිවෙලක් නොමැති තත්ත්වයක පවතින බව අනාවරණය විය. අපද්‍රව්‍ය නියමිත ස්ථානය ඉදිරිපස එකතු වී තිබීම පමණක් | ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ කළමනාකරණය විසින් විගණන කණ්ඩායම සිය භෞතික පරීක්සාවේදී නිරීක්ෂණය කළ පිළිවෙලක් නොමැතිකම සම්බන්ධයෙන් මතු කළ කරුණු පිළිගන්නා ලද බව. | පරිසරයේ පිරිසිදුකම ආරක්ෂා කරමින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සුදුසු පරිදි සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොව ප්‍රවේශ මාර්ග ද ඇතුලුව එම ප්‍රදේශය පුරාම විසිරී තිබෙන බවද දක්නට ලැබුණි. | | |
| (ඩ) | බියගම අපනයන සැකසුම් කලාපය තුළ ඊටම වෙන් වූ ඉන්ධනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා පර්චස් 40 ක් පුරා පැතිරුණු ලොට් අංක 43 බී වෙන් කිරීම මණ්ඩලය විසින් අනුමත කර තිබුණු අතර මාස 6 ක සහන කාලයක් ලබා දෙමින් 2022 මැයි 30 දින අනුමත ලිපිය නිකුත් කර තිබුණි. මුළු කොන්ත්‍රාත් වටිනාකම ඇ. ඩොලර් 5,000,000 ක් වූ අතර මාස 12 ක් තුළ අවම ආයෝජනය ඇ. ඩොලර් 250,000 ක් ප්‍රේෂණය කළ යුතු විය. කෙසේ නමුත්, සමාගම අවම ආයෝජනය වූ ඇ. ඩොලර් 250,000 ප්‍රේෂණය කර නොතිබුණු අතර වෙන් කළ මාස 6 ක කාලය තුළ ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ බලපත්‍රය සමග අදාළ අවශ්‍ය ලේඛනමය සාක්ෂි ද ඉදිරිපත් කර නොතිබුණි. 2023 ඔක්තෝබර් 30 දිනට එනම් ඉඩම වෙන් කිරීමට මාස 17 කට වඩා වැඩි කාලයක් සමාගම විසින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර මෙම ගැටළු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ඉදිරි පියවර ගෙන නොතිබුණි. | ලංකා ඛනිජ තෙල් සංස්ථාව වෙනුවට ඉන්දියානු තෙල් සමාගමෙන් හෝ වෙනත් පාර්ශවයකින් ආයෝජකයා අලෙවි නියෝජිතභාවයක් ලබා ගත යුතු අතර, විදුලි බලය සහ බලශක්ති අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය අනුමැතිය තවමත් ලැබී නොමැති බව සහ එය මණ්ඩලයේ පාලනයෙන් බැහැර වන බව. | අනුමත ලිපියට අනුකූලව පියවර ගත යුතුය. |
| (ඪ) | කටුනායක අපනයන සැකසුම් කලාපයේ අක්කර 16 ක් කල්බදු ක්‍රමයට ලබා දීමට නිදහස් වෙළඳ කලාප ක්‍රීඩා සංගමය (FTZSA) සමඟ 1988 සැප්තැම්බර් 27 දින මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබුණි. 2018 සැප්තැම්බර් 26 දිනට කල්බදු කුලිය අක්කරයකට රු.200 ක් විය. 2014 සැප්තැම්බර්, 2017 ජූනි සහ 2018 අප්‍රේල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම අගය සමාලෝචනය කර තිබුණු අතර ස්වාධීන තක්සේරුකරුවෙකුගේ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව වර්ෂ 30 කාලයක් සඳහා අක්කරයකට රු.1,000 ක් වශයෙන් බිම් කුලිය වැඩි කිරීමට යෝජනා කර තිබුණි. කෙසේ වෙතත් රු.200 රු.1000 දක්වා වැඩි කිරීම සඳහා මණ්ඩලය වර්ෂ 4 ක කාලයක් ගත කර තිබුණි. 1999 වර්ෂයේදී, මණ්ඩලය විසින් FTZSA වෙනුවෙන් නගර සංවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස 2001 දී රු. මිලියන 2 ක් ද 2005 දී රු. මිලියන 0.5 ක් ද ලබා දෙමින් මෙම ක්‍රීඩා පිටිය මුළුමනින්ම | ආයතනික සමාජීය වගකීමට අදාළ කටයුත්තක් ලෙස කටුනායක අපනයන සැකසුම් කලාපයේ ආයතනයන්හි සේවකයන් වෙනුවෙන් පහසුකම් සළසා දීමට විශේෂයෙන්ම විවිධ ක්‍රීඩාවන්ට සහ සුඛසාධන කටයුතු සඳහා ලබා දෙමින් මෙම ක්‍රීඩා සංකීර්ණය නිදහස් වෙළඳ කලාප ක්‍රීඩා සංගමය වෙත වෙන් කර දී තිබේ. එලෙසම, FTZSA ලාභ උපයන ආයතනයක් නොවන බව සහ කලාපයේ සේවකයින්ගේ ප්‍රතිලාභය වෙනුවෙන් පමණක් මෙම ක්‍රීඩා කටයුතු පවත්වා ගෙන යන බව. එලෙසම එදිනෙදා නඩත්තු කටයුතු සහ වෙනත් සේවාවන්වල වෙන් කිරීම් පවත්වා ගෙන යාම පිණිස වර්තමානයේදී ක්‍රීඩා පිටිය කලින් වෙන් කරවා ගැනීම සඳහා ඔවුන් වාරිකයක් අය කරනු ලබන බව. 2018 අප්‍රේල් 06 දිනැති මණ්ඩල තීරණයට අනුව, එම මුදලින් සියයට 10 | තීරණයක් ගැනීමට පෙර අදාළ සියලුම සාධක සැළකිල්ලට ගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රතිසංස්කරණය කර තිබුණි. වර්තමානයේදි, ක්‍රීඩා සංකීර්ණය, පහළ ක්‍රීඩා පිටිය සහ ඉහළ ක්‍රීඩා පිටිය ලෙස කොටස් 2 ක් පෙන්නුම් කරයි. පහළ ක්‍රීඩා පිටිය සතුව මණ්ඩපයක් පවතින අතර එය අභ්‍යන්තර පාර්ශව සඳහා රු.25,000 ක් සහ බාහිර පාර්ශ්ව සඳහා රු.35,000 ක් ලෙස දෛනික ගාස්තුවට ලබා දී තිබුණි. එලෙසම, ඉහළ ක්‍රීඩා පිටිය සතුව ද මණ්ඩපයක් පවතින අතර එහි දෛනික කුලී ගාස්තුව රු.80,000 කි. භූමියෙහි හිමිකාරීත්වය මණ්ඩලය සතු වීම මෙන්ම පිටිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මිලියන 2.5 ක් වැය කිරීම සිදු කර තිබුණද මණ්ඩලය උපයා ගත හැකිව තිබුණේ වාර්ෂිකව රු.16,000 ක් පමණක් විය. | නොඉක්මවන මුදලකට සෑම වසර 03 කට වරක්ම සංශෝධනය කිරීමේ විධිවිධාන සහිතව මණ්ඩලය විසින් වාර්ෂික බිම් කුලිය අක්කරයකට රු.1,000 දක්වා වැඩි කරන ඇත. | |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට කලාප 14 ක් අතරින් එකතුව අක්කර 989 ක් හිස්ව පැවති අතර ඉන් කලාප 4 ක් සියයට 40 කට වඩා වැඩි පුරප්පාඩු අනුපාතයන් පෙන්නුම් කර තිබුණි. ඊට අමතරව, කිසිදු ආයෝජනයක් නොමැතිව අක්කර 785.1055ක් වූ කලාපවලට අයත් නොවන ඉඩම් 9 ක් 2023 දෙසැම්බර් 31 දිනට හිස්ව පැවතුණි. | හිස්ව පවතින ඉඩම්, ආයෝජකයන් අතරේ ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය අඛණ්ඩව පියවර ගන්නා බව. | හිස්ව පවතින ඉඩම්, ආයෝජකයන් අතරේ ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය පියවර ගත යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයෝජන මණ්ඩලය විසින් බියගම කලාපයේ පොදු අපජල පවිත්‍රාගාරයේ ඔක්සිකරණ වළ සඳහා වානේ ව්‍යුහයක් සහිත වාතන යන්ත්‍ර දෙකක් සැපයීම සහ සවි කිරීම සම්බන්ධයෙන් පිරිවැය රු.90,243,920 ක් වූ දෙපාර්තමේන්තු ඇස්තමේන්තුව ආයෝජන මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. නමුත් මුල් ඇස්තමේන්තුවට වඩා රු.36,395,207 කින් සීමාව ඉක්මවමින් පිරිනමන ලද ලංසු මිල රු.126,639,127 ක් විය. තවද, දෙපාර්තමේන්තුමය ඇස්තමේන්තුව සියයට 144 කින් ඉක්මවන බී කොටසේ ඇවිදීමේ මංතීරුවල කාණු වැඩිදියුණු කිරීමට අදාළ ප්‍රසම්පාදනය සඳහා ලංසු ඇගයීම් කිරීමේ | ලංසු ඇගයීම් කිරීමේ කාල සීමාව තුළදී සහ සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලංසුකරු තෝරා ගැනීමට පෙර, ඇස්තමේන්තු සංශෝධනයන් සිදු කර තිබුණු බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතුය. |

කාලය තුළ සංශෝධිත ඇස්තමේන්තුව සකස් කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3 ට අනුකූලව මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු වුවද ඒ අනුව මණ්ඩලය ක්‍රියා කර නොතිබුණි.

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයෝජන මණ්ඩල වයඹ ප්‍රදේශීය කාර්යාලයේ (NWRO) අධ්‍යක්ෂවරයා විසින් මාවතගම අපනයන සැකසුම් කලාපයේ අපජල පිරිපහදු පවිත්‍රාගාරය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් 2019 නොවැම්බර් 26 දින ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණද, අදාළ කොන්ත්‍රාත්තුව මාස 20 ක ප්‍රමාදයක් වාර්තා කරමින් 2021 ඔක්තෝබර් 21 දින පිරිනමා තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් මිල රු.3,282,375 දක්වා සියයට 33 කින් වැඩි වී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව දින 180 ක කාලයක් තුළ නිම කර භාර දීමේ අවශ්‍යතාවයක් සහිතව 2022 අප්‍රේල් 18 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කෙසේ නමුත්, මාස 8 ක ප්‍රමාදයක් ඇතිව ඉදිකිරීම 2022 දෙසැම්බර් 23 දින භාර දී තිබුණි. අපජල පිරිපහදු පවිත්‍රාගාරය ක්‍රියාත්මක කිරීමෙන් පසුව, නිෂ්පාදකයාගේ දෝෂ හේතුවෙන් වාතන යන්ත්‍ර හතරේම දෝෂ හඳුනාගෙන ඒවා කොන්ත්‍රාත්කරුගේ වියදමින් ප්‍රතිස්ථාපනය කර තිබුණි. කෙසේ නමුත්, 2024 මැයි 20 වන විගණිත දින වන විටත් වාතන යන්ත්‍ර 2 ක් තවදුරටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු අතර අනෙකුත් කලාපවලට සමගාමීව මෙම දෝෂ වළක්වා ගැනීම සඳහා මණ්ඩලය විසින් මෙම ඉදිකිරීම ප්‍රමාණවත් පරිදි සැලසුම් කර අධීක්ෂණය කර නොතිබීම ඉන් පෙන්නුම් කර තිබුණි. මෙය කලාපයේ සුමට ක්‍රියාකාරිත්වය අවදානමට පත් කරනු ලබන අතර කලාපයේ ආයෝජකයින් සමඟ ධනාත්මක සබඳතා පවත්වා ගැනීමට සැලකිය යුතු අවදානමක් ඇති කරනු ලබයි. | කොවිඩ් 19 ව්‍යාප්තිය, ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට බලපෑ ඇත. වලංගු හේතු සළකා බලමින් කොන්ත්‍රාත්කරු වෙත කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇත. දෝෂ සඳහා වගකීම් කාලසීමාව තුළදී අදාළ සියලු යන්ත්‍ර හතරෙහිම දෝෂ/ගැටළු පැන නැඟී ඇත. කලින් කලට කොන්ත්‍රාත්කරු විසින් එම දෝෂ අළුත්වැඩියා කිරීම සිදු කළද උපදේශකවරයා (ජාතික ජල සම්පාදන සහ ජල පවාහන මණ්ඩලය) අළුත්වැඩියා කිරීම් පිළි නොගත් අතර ඒ හේතුවෙන් දෝෂ නැවත නැවතත් ඇති විය. | හදිසි අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කලාපයේ කළමනාකරණයෙන් ලැබෙන ඉල්ලීම්වලට ප්‍රමුඛතාවයක් ලබා දෙමින් ගැටලුව විසඳීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ සිට පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපයේ එක් ආයෝජකයෙකු ගංවතුර තත්ත්වයකට මුහුණදී තිබුණ අතර එමගින් රු.1,000,000,000 ක දේපළ හානි වීමක් සිදු වී ඇත. මණ්ඩලය විසින් මූලික අධ්‍යනයක් සඳහා සහ ගංවතුරෙන් ආරක්ෂා වීමට පස් බැම්මක් ඉදි කිරීම සඳහා රු.60,000 ක උපදේශන ගාස්තුවක් ගෙවා උපදේශකවරයෙක් පත් කර තිබුණි. කෙසේ නමුත්, එවැනි පුද්ගලයෙකු උපදේශකවරයෙක් ලෙස තෝරා පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. ඉදි කළ බැම්ම ගංවතුර සඳහා විසඳුමක් වී නොතිබුණු අතර භූමියේ භූ විෂමතාවය සැළකිල්ලට නොගෙන බැම්ම ඉදිකර තිබීම ඊට හේතු වී තිබුණි. එබැවින් ආයෝජකයින්ට ඔවුන්ගේ වත්කම් ආරක්ෂා කර ගනිමින් ප්‍රශස්ත සේවා සැපයීම සඳහා තත්ත්වය ප්‍රමාණවත් ලෙස විශ්ලේෂණය කිරීමට සහ කලාපය ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ආයෝජකයා තවමත් ගංවතුරෙන් පීඩා විඳිනු ලබයි. | කුඩා ඔය අසළ ඉඩමේ පහළම ස්ථානයේ සිට මීටර් 1.5 ක උසකින් බැම්ම ඉදි කර ඇත. ඉඩමේ පවතින මට්ටම් අනුව බැම්මේ උස වෙනස් වී ඇත. කෙසේ නමුත්, මෙම ප්‍රදේශයේ පළමු මට්ටමේ සාමාන්‍ය ගංවතුර තත්ත්වයක් සඳහා මෙම බැම්ම ඉදි කර ඇති බව සහ මෙම වර්ෂය තුළදී කොන්ක්‍රීට් තාප්පයක් මගින් බැම්ම උස් කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් යෝජනා කර තිබෙන බව. උපදේශකවරයාට අනුව, එකී ආයෝජකයාගේ ගොඩනැගිල්ල සහ ගඟ අතර ඇති ඉඩ, මීටර් 1.5 කට වඩා වැඩි උසකින් පස් බැම්මක් නිර්මාණය කිරීමට ප්‍රමාණවත් නොවන බව. | කලාපයක සැකැස්ම සැලසුම් කිරීමේදී, එවැනි ගැටළු පෙර සූදානමකින් යුතුව විසඳා ගත යුතු අතර, කලාපයේ අනාගත ගංවතුර තත්ත්වයන් වැළැක්වීම සඳහා වහාම පියවර ගත යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 1,299 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 1,111 ක් විය. ඒ අනුව, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 242 කි. තවද, ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයින්ගේ අතිරික්තය 54 ක් විය. | ප්‍රාථමික මට්ටමේ සියලු වැඩිපුර සිටින සේවකයින් අනියම්/ කොන්ත්‍රාත් ආරක්ෂක නිලධාරීන් වන අතර ඔවුන් කැබිනට් තීරණයක් මත නිකුත් කළ 2019 සැප්තැම්බර් 18 දිනැති අංක 29/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2019 සැප්තැම්බර් 01 දින ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර ඇත. තවද, වැඩිපුර සිටින කළමනාකරණ සහයක සේවකයන් (තාක්ෂණික කාණ්ඩය) තාක්ෂණික සහයකවරුන් වන අතර ඔවුන් බිංගිරිය, එරාවූර් සහ හම්බන්තොට නව කලාප තුනෙහි පිහිටුවීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් බඳවා ගෙන ඇත. මේ | මණ්ඩලයේ සේවක මණ්ඩලය නිරන්තරයෙන්ම සමාලෝචනය කළ යුතු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව අවශ්‍ය ගැලපිලි සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධයෙන් නව තනතුරු ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම් කර ඇත. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බියගම අපයනන සැකසුම් කලාපය තුළ අක්කර 5 ක් පුරා දිවෙන අඩි 30 – 40 ක් පමණ ගැඹුරු අත්හැර දැමුණු ගල් වලක් පවතින අතර වර්තමානයේදී එය වැහි වතුර එකතු වීමෙන් ජලාශ්‍රයක් බවට පත්ව තිබුණි. 1997 වර්ෂය දක්වා බාහිර ආයතනයක් විසින් එම ගල් වල ක්‍රියාත්මක කර තිබුණු අතර කැණීම් කළ ද්‍රව්‍යයන් කලාපයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. වැහි කාලයේදී වැහි වතුර ඉවතට ගලායමින් ඒ අවට ගම්මානවලට ගංවතුර තත්ත්වයක් ඇති වන අතර ගම්වාසීන් විසින් මණ්ඩලයට විරුද්ධව පැමිණිලි රාශියක් සිදු කර තිබුණි. 2023 නොවැම්බර් 30 දින වන විටත් මෙම ගැටළුව එලෙසම නොවිසඳී පැවතුණි. | ගංවතුර තත්ත්වයට පිළියම් යෙදීම සඳහා අදාළ සියලු පාර්ශවයන් සමග මණ්ඩලය සාකච්ඡා කර ඇත. ගම්පහ සම්බන්ධීකරණ කමිටුව විසින් ගෙන තිබුණු තීරණ පිළි ගෙන ගංවතුර ගැටළුව අවම කිරීම ඉලක්ක කරමින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව අරමුදල් නිදහස් කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගනු ඇත. | ගංවතුර අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු අතර අනාගතයේදී මෙවැනි ගැටළු වළක්වා ගැනීම සඳහා පෙර සූදානමකින් යුතුව පියවර ගත යුතුය. |
| (ආ) | බියගම කලාපයේ දෛනික සාමාන්‍ය ජල පරිභෝජනය ඝන මීටර් 21,000 වන අතර, දැනට පිරිපහදු කළ අපද්‍රව්‍ය, අඹතලේ ජල පරිභෝජනයට ගන්නා ස්ථානයට ඉහළ කොටසේ පිහිටා ඇති රටේ ප්‍රධානතම ජල සැපයුම වන කැලණි ගඟට සම්බන්ධ වන ස්වාභාවික ජල පහරකට මුදා හරිනු ලැබේ. සිදු විය හැකි පිරිපහදු නොකළ මුදාහැරීම් සහ අන්තරායකර ද්‍රව්‍ය සමුච්චය වීම හා සම්බන්ධ බරපතල සෞඛ්‍ය අවදානම් අවම කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගඟේ පහළ කොටසට පිරිපහදු කළ අපද්‍රව්‍ය පොම්ප කිරීමේ ව්‍යාපෘතියක්, ප්‍රංශයේ Credit Agricole Corporate & Investment Bankහි ව්‍යාපෘතියක් යටතේ රු.මිලියන 32,000 ක වියදමින් 2017 ජනවාරි 23 දින ආරම්භ කර වසර 3 ක් ඇතුළත නිම කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, නල එළීමේ කටයුතු අවසන් කිරීමට මහජන විරෝධතා හේතුවෙන් බාධා එල්ල වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අවසන් මීටර් 160 නල | 2024 අප්‍රේල් 15 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද බව. | ස්ථාපිත කාලසීමාවන් සමග ව්‍යාපෘති අනුකූල විය යුතු අතර විදේශ අරමුදල් උපරිම ලෙස භාවිතා කිරීමට උත්සාහයන් ගත යුතුය. |

එළීම 2019 දෙසැම්බර් මාසයේ සිට අත්හිටුවා තිබුණි. විසඳුමකින් තොරව දිර්ඝ ප්‍රමාදයන් සිදු වූ බැවින්, අවසානයේදී ව්‍යාපෘතිය ඉල්ලා අස්කර ගන්නා ලද අතර අරමුදල් නවතා දමා තිබුණි. පසුව, 2023 ප්‍රාග්ධන අයවැයෙන් රු.මිලියන 95 ක් වෙන් කිරීම යටතේ ඉතිරි වැඩ කටයුතු කරගෙන යාමට මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. 2024 ජනවාරි 05 වන විට ව්‍යාපෘතිය ලංසු තැබීමේ අදියරේ පැවතුණි. මෙම ව්‍යාපෘතියේ ප්‍රමාදයන් මහජන සෞඛ්‍යයට අහිතකර බලපෑමක් ඇති කරනු ලබන අතර ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන් කිරීම, මණ්ඩලය සිදු කළ යුතුව තිබුණි.